ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2019 නොවැම්බර් මස 15 දින |

## විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය - 2019 සැප්තැම්බර්

### සමස්ත නිරීක්ෂණ

ආනයන වියදම අඩු වීම ඉක්මවා අපනයන ආදායම අඩු වීමත් සමඟ 2019 සැප්තැම්බර් මාසයේදී වෙළඳ හිඟය පෙර වසරේ අනුරූප කාලයට සාපේක්ෂව පුළුල් විය. එසේ නමුත්, සමුච්චිත වශයෙන් සැලකීමේදී, ඉහළ ගිය අපනයන ආදායම සහ සැලකිය යුතු ලෙස පහළ ගිය ආනයන වියදම හේතුවෙන් 2019 වසරේ පළමු මාස නවය තුළ වෙළඳ හිඟය පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සැලකිය යුතු පහළ මට්ටමක පැවතුණි. මේ අතර, සංචාරක පැමිණීම්වල පහත වැටීමේ වේගය 2019 සැප්තැම්බර් මසදී තවදුරටත් අඩු විය. විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සමුච්චිත පදනම මත අඩු වුවද, 2019 සැප්තැම්බර් මාසයේදී පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව වැඩි විය. 2019 සැප්තැම්බර් මස මූල්‍ය ගිණුම තුළ කොළඹ කොටස් වෙළඳපොළ සහ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් විදේශීය ආයෝජන ශුද්ධ ගෙවීම් වාර්තා විය. 2019 සැප්තැම්බර් මස රුපියල අවප්‍රමාණය වීමේ පීඩනයකට ලක් වුවද 2019 වසරේ පළමු මාස නවය තුළ දී ශ්‍රී ලංකා රුපියල, ප්‍රධාන ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව අතිප්‍රමාණය විය.






ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙළඳ භාණ්ඩ ක්‍රියාකාරිත්වය පිළිබඳව වැඩිදුර තොරතුරු ඇතුළත් ‘මාසික වෙළඳ විවරණිකාව’ ප්‍රකාශයට පත් කරනු ලබන අතර එය ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියෙන් ලබා ගත හැක. සංඛ්‍යාති > ආර්ථික දර්ශක > මාසික වෙළඳ විවරණිකාව https://www.cbsl.gov.lk/si/node/6181

**සංඛ්‍යා සටහන 1: විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය (අ)**

| කාණ්ඩය | 2018 සැප්. එ.ජ.ඩො. මිලියන | 2019 සැප්. එ.ජ.ඩො. මිලියන | වෙනස (%) | 2018 ජන.- සැප්. එ.ජ.ඩො. මිලියන | 2019 ජන.- සැප්. එ.ජ.ඩො. මිලියන | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| අපනයන | 1,055 | 952 | -9.8 | 8,898 | 8,983 | 1.0 |
| ආනයන | 1,768 | 1,711 | -3.3 | 16,851 | 14,596 | -13.4 |
| වෙළඳ ශේෂය (ශුද්ධ) | -713 | -758 | | -7,953 | -5,613 | |
| සංචාරක ඉපැයීම් | 280 (ආ) | 204 (ඇ) | -27.2 | 3,251(ආ) | 2,583 (ඇ) | -20.5 |
| විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ | 500 | 516 | 3.3 | 5,277 | 4,930 | -6.6 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඈ) | -7 | -7 | | 37 | 15 | |
| රාජ්‍ය අංශයේ ලැබීම් (දළ) | 160 | 97 | | 4,313 | 5,920 | |
| භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර | 25 | 22 | | 681 | 454 | |
| දිගුකාලීන ණය | 135 | 75 | | 1,132 | 1,066 | |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | - | - | | 2,500 | 4,400 | |
| ජා.මූ. අරමුදල - විස්තීර්ණ ණය පහසුකම | - | - | | 252 | 164 | |
| විදේශ ඍජු ආයෝජන (ඉ) | | | | 1,422 | 501 | |
| සමස්ත ශේෂය | | | | -650 | 789 | |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, කොළඹ කොටස් වෙළඳපොළ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

(අ) තාවකාලික
(ආ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2018 වර්ෂය සඳහා සිදු කළ සමීක්ෂණයට අනුව ඇස්තමේන්තු කළ සංචාරකයකු මෙරට ගත කරන සාමාන්‍ය කාලය සහ සංචාරකයකුගේ සාමාන්‍ය දෛනික වියදමට අනුව සංශෝධිතය
(ඇ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2019 වර්ෂය සඳහා එහි සමීක්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු මෙම තාවකාලික ඇස්තමේන්තු සංශෝධනය විය හැකිය
(ඈ) ද්විතීයික සහ ප්‍රාථමික වෙළඳපොළ ගනුදෙනු ඇතුළත් වේ
(ඉ) සෑම කාලපරිච්ඡේදයක් සඳහාම දත්ත පවතිනුයේ පළමු මාස හය සඳහා වන අතර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් වාර්තා කළ පරිදි ඍජු ආයෝජන සමාගම් වෙත වූ විදේශීය ණය සහ කොටස් වෙළෙඳපොළ වෙත වූ ශුද්ධ ඍජු ආයෝජන ඇතුළත් වේ

## වෙළඳ හිඟය හා වෙළඳ මිල අනුපාතය

- 2019 සැප්තැම්බර් මාසයේදී වෙළඳ හිඟය 2018 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේදී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 713 ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 758 ක් දක්වා පුළුල් විය. කෙසේ වුවද සමුච්චිත වශයෙන් සැලකූ විට, 2019 වසරේ පළමු මාස නවය තුළදී වෙළඳ හිඟය 2018 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේදී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 7,953 ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 5,613 ක් දක්වා එ.ජ. ඩොලර් මිලියන 2,341 කින් අඩු විය. වෙළඳ හිඟය අඩු වීම සඳහා ප්‍රධාන වශයෙන් දායක වූ අයිතම රූප සටහන 1 මගින් දැක්වේ.
- මේ අතර, අපනයන මිල ගණන්වලට සාපේක්ෂව ආනයන මිල නිරූපණය කරන වෙළඳ මිල අනුපාතය පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 2.5 කින් අඩු වූ අතර, ඒ සඳහා ආනයන මිල ගණන් පහළ යෑමේ වේගයට වඩා වැඩි වේගයකින් අපනයන මිල ගණන් පහළ යෑම හේතු විය. සමුච්චිත වශයෙන් සැලකූ විට, 2019 වසරේ පළමු මාස නවය තුළදී වෙළඳ මිල අනුපාතය පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 0.4 කින් අඩු විය.

**රූප සටහන 1: වෙළඳ හිඟය අඩු වීම සඳහා දායක වූ ප්‍රධාන අයිතම : 2019 ජනවාරි - සැප්තැම්බර් (එ.ජ. ඩොලර් මිලියන)**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 2: මාසික වෙළඳ හිඟය (2018 – 2019)**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 3: වෙළඳ මිල අනුපාතය (2018 – 2019)**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ අපනයන ක්‍රියාකාරීත්වය

- සියලුම ප්‍රධාන කාණ්ඩවල අපනයන ආදායම පහත වැටීම හේතුවෙන් 2019 සැප්තැම්බර් මාසයේදී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 952 ක් දක්වා සියයට 9.8 කින් කැපී පෙනෙන ලෙස අඩු විය. 2018 ජූලි මාසයට පසුව ප්‍රථම වරට රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව පහත වැටුණු අතර ඒ සඳහා යුරෝපා වෙළඳපොළ වෙත සිදු කළ ඇඟලුම් අපනයනයෙන් ලද ආදායම සියයට 3.2 කින් වර්ධනය වුව ද, පදනම් බලපෑම තුළින් ඇමෙරිකා එක්සත් ජනපදය වෙත සිදු කළ ඇඟලුම් අපනයනවලින් ලද ආදායම සියයට 13.9 කින් කැපී පෙනෙන ලෙස පහත වැටීම හේතු විය. ප්‍රධාන වශයෙන් පාස්කු ඉරුදින සිදු වූ ප්‍රහාරවලට පසුව ශ්‍රී ලංකාවේ ගුවන් ගමන් ක්‍රියාකාරීත්වය මන්දගාමී

වීම නිසා ගුවන්යානා සඳහා යොදාගනු ලබන ඉන්ධන අපනයනය පහත වැටීම හේතුවෙන් මෑත කාලයේදී දක්නට ලැබුණු ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයන ආදායම පහත වැටීමේ ප්‍රවණතාව අඛණ්ඩව පැවතුණි. මීට අමතරව, පාවහන් අපනයනය පහත වැටීම හේතුවෙන් සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් අපනයන ආදායම පහත වැටුණු අතර, ටයර් අපනයන අඩු වීම හේතුවෙන් රබර් නිෂ්පාදිත අපනයන ආදායම පහත වැටුණි. කෙසේ වුවද, මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ අපනයන ආදායම ඉහළ ගියේය.

- එළවළු සහ සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත හැර අනෙකුත් සියලුම උප කාණ්ඩවල අපනයන ආදායම් අඩුවීම හේතුවෙන් 2019 සැප්තැම්බර් මාසයේදී කෘෂිකාර්මික අපනයන ආදායම පහත වැටුණි . 2019 සැප්තැම්බර් මාසයේදී තේ අපනයන ආදායම පහත වැටුණු අතර, ඒ සඳහා තේ අපනයන පරිමාව අඩු වීමත්, ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි තේ මිල ගණන් අඩු වීමත් සමඟ තේ අපනයන මිල ගණන් පහත වැටීමත් හේතු විය. මීට අමතරව, ප්‍රධාන වශයෙන් කුරුඳු සහ ගම්මිරිස් අපනයන පරිමාව අඩු වීම හේතුවෙන් කුළුබඩු අපනයන ආදායම පහත වැටුණු අතර අපනයන පරිමාව අඩුවීම හේතුවෙන් මුහුදු ආහාර අපනයනය පහත වැටුණි. කෙසේ වුවද, නැවුම් එළවළු, පලතුරු සහ ආහාරයට ගනු ලබන ඇට වර්ග අපනයනය ඉහළ යෑම හේතුවෙන් එළවළු සහ සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත අපනයන ආදායම ඉහළ ගියේය.
- සියලුම උප කාණ්ඩවල දුර්වල ක්‍රියාකාරිත්වය හේතුවෙන් 2019 සැප්තැම්බර් මාසයේදී ඛනිජ අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව පහත වැටුණි.
- 2019 සැප්තැම්බර් මාසයේදී පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව අපනයන පරිමා දර්ශකය සියයට 1.7 කින් ද, අපනයන මිල දර්ශකය සියයට 8.2 කින් ද පහත වැටුණි. මේ අනුව, 2019 සැප්තැම්බර් මාසයේදී අපනයන ක්‍රියාකාරිත්වය දුර්වල වීම සඳහා අපනයන පරිමාව හා මිල ගණන් යන සාධක ද්විත්වයෙහිම පහළ යෑම හේතුවිය.

**රූප සටහන 4: මාසික අපනයන ක්‍රියාකාරිත්වය**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 5: අපනයන පරිමා දර්ශකය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 2: වෙළඳ භාණ්ඩ අපනයන ආදායම (අ)**

| කාණ්ඩය | 2018 සැප්. (එ.ජ. ඩොලර් මිලියන) | 2019 සැප්. (එ.ජ. ඩොලර් මිලියන ) | වෙනස (%) | 2018 ජන.- සැප්. (එ.ජ. ඩොලර් මිලියන) | 2019 ජන.- සැප්. (එ.ජ. ඩොලර් මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **814.4** | **745.9** | **(8.4)** | **6,899.6** | **7,076.9** | **2.6** |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 36.0 | 33.6 | (6.9) | 347.2 | 337.3 | (2.8) |
| සත්ත්ව ආහාර | 9.2 | 6.1 | (33.5) | 82.8 | 94.9 | 14.6 |
| රෙදිපිළි හා ඇඟලුම් | 476.2 | 450.2 | (5.5) | 3,927.9 | 4,186.8 | 6.6 |
| එයින් ඇඟලුම් | 444.7 | 419.1 | (5.8) | 3,666.9 | 3,897.6 | 6.3 |
| රෙදිපිළි | 24.4 | 23.0 | (5.7) | 190.4 | 210.5 | 10.6 |
| වෙනත් රෙදිපිළි සැකසුම් | 7.2 | 8.2 | 13.8 | 70.7 | 78.7 | 11.4 |
| රබර් නිෂ්පාදිත | 71.8 | 70.9 | (1.2) | 656.2 | 662.2 | 0.9 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 19.2 | 24.6 | 28.4 | 214.5 | 224.5 | 4.7 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 32.6 | 33.0 | 1.1 | 328.4 | 308.0 | (6.2) |
| ප්‍රවාහන උපකරණ | 7.2 | 7.0 | (2.6) | 98.3 | 127.5 | 29.7 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 65.9 | 38.7 | (41.3) | 453.8 | 367.0 | (19.1) |
| රසායනික නිෂ්පාදිත | 13.3 | 13.7 | 3.2 | 128.0 | 134.1 | 4.8 |
| දැව හා කඩදාසි නිෂ්පාදිත | 11.8 | 10.6 | (10.6) | 104.3 | 101.4 | (2.8) |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 4.1 | 1.7 | (58.3) | 23.3 | 33.1 | 41.9 |
| සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 17.1 | 8.1 | (53.0) | 119.0 | 82.2 | (31.0) |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 6.6 | 5.8 | (11.5) | 57.3 | 55.1 | (3.8) |
| මූල ලෝහ හා උපාංග | 15.5 | 14.3 | (7.7) | 123.5 | 135.3 | 9.5 |
| පිඟන් මැටි නිෂ්පාදිත | 3.2 | 3.2 | (0.3) | 24.0 | 22.8 | (5.0) |
| වෙනත් | 24.5 | 24.4 | (0.6) | 211.1 | 204.7 | (3.0) |
| **2. කෘෂිකාර්මික අපනයන** | **234.3** | **201.5** | **(14.0)** | **1,957.7** | **1,868.9** | **(4.5)** |
| තේ | 122.5 | 110.4 | (9.9) | 1,092.8 | 1,025.3 | (6.2) |
| රබර් | 2.1 | 1.5 | (31.3) | 25.1 | 20.1 | (20.1) |
| පොල් | 28.7 | 26.3 | (8.3) | 238.1 | 258.5 | 8.6 |
| කුළුබඩු | 43.7 | 31.4 | (28.2) | 269.3 | 234.8 | (12.8) |
| එළවළු | 2.6 | 2.9 | 8.5 | 20.9 | 24.1 | 15.1 |
| සකස් නොකළ දුම්කොළ | 3.1 | 3.1 | (0.1) | 26.7 | 25.8 | (3.5) |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 9.7 | 10.0 | 3.0 | 93.8 | 80.0 | (14.7) |
| මුහුදු ආහාර | 21.7 | 15.9 | (26.5) | 191.0 | 200.4 | 4.9 |
| **3. ඛනිජ අපනයන** | **4.9** | **3.3** | **(32.6)** | **27.2** | **24.7** | **(9.2)** |
| **4. වර්ග නොකළ අපනයන** | **1.6** | **1.4** | **(16.1)** | **13.1** | **12.7** | **(3.4)** |
| **මුළු අපනයන** | **1,055.2** | **952.1** | **(9.8)** | **8,897.6** | **8,983.2** | **1.0** |

(අ) තාවකාලික

මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය

- 2019 සැප්තැම්බර් මාසයේදී වෙළඳ භාණ්ඩ ආනයන වියදම අඛණ්ඩව එකොළොස්වැනි මාසයටත් එ.ජ. ඩොලර් මිලියන 1,711 ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 3.3 කින් පහත වැටුණු අතර ඒ සඳහා පාරිභෝගික භාණ්ඩ සහ අන්තර් භාණ්ඩ ආනයනය අඩු වීම හේතුවිය.
- 2019 සැප්තැම්බර් මාසයේදී පාරිභෝගික භාණ්ඩ ආනයනය පහත වැටීම සඳහා ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනය අඩු වීම දායක වූ අතර, ආහාර හා පාන වර්ග ආනයන වියදම ඉහළ ගියේය. 2019 සැප්තැම්බර් මාසයේදී පෞද්ගලික භාවිතය සඳහා ගනු ලබන රථවාහන ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව පහත වැටුණි. කෙසේ වුවද, ප්‍රධාන වශයෙන් සහනදායි බලපත්‍ර යටතේ පෞද්ගලික මෝටර් රථ ආනයනය කිරීමෙහි බලපෑම පිළිබිඹු කරමින්, 2018 දෙසැම්බර් සිට 2019 ජුනි මාසය දක්වා කාලය තුළ වාර්තා වූ රථවාහන ආනයන වියදම් අගයන්වලට සාපේක්ෂව 2019 ජූලි මාසයේ සිට රථවාහන ආනයනය සාපේක්ෂව ඉහළ මට්ටමක පැවතුණි. මේ අතර, අර්තාපල් සඳහා වූ දේශීය සැපයුම අඩු වීමේ ප්‍රතිඵලයක් ලෙස අර්තාපල් ආනයන පරිමාව ඉහළ යෑම හේතුවෙන් එළවළු යටතේ වර්ග කර ඇති අර්තාපල් ආනයනය ඉහළ යෑම, ආහාර හා පාන වර්ග ආනයන වියදම ඉහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් හේතුවිය.
- ප්‍රධාන වශයෙන් පිරිපහදු කළ ඛනිජ තෙල් ආනයන පරිමාව මෙන්ම ආනයන මිල ගණන් ද පහත වැටීම හේතුවෙන් ඉන්ධන ආනයන වියදම අඩුවීම නිසා 2019 සැප්තැම්බර් මාසයේ දී අන්තර් භාණ්ඩ ආනයන වියදම පහත වැටුණි. මීට අමතරව, යකඩ හා වානේ ආනයනය අඩු වීම හේතුවෙන් 2019 සැප්තැම්බර් මාසයේදී මූල ලෝහ ආනයන වියදම පහත වැටුණි. කෙසේ වුවද, රෙදි වර්ග ආනයනය ඉහළ යෑම හේතුවෙන් රෙදිපිළි හා රෙදිපිළි උපාංග ද සිමෙන්ති ක්ලින්කර ආනයනය ඉහළ යෑම හේතුවෙන් ඛනිජ නිෂ්පාදිත ආනයන වියදම ද ඉහළ ගියේය.
- මේ අතර, සියලුම උප කාණ්ඩවල ආනයනය ඉහළ යෑම හේතුවෙන් 2019 සැප්තැම්බර් මාසයේදී ආයෝජන භාණ්ඩ ආනයන වියදම ඉහළ ගියේය. මේ අනුව, ප්‍රධාන වශයෙන් විදුලි මෝටර් සහ විදුලි උත්පාදක යන්ත්‍ර ආනයනය ඉහළ යෑම හේතුවෙන් යන්ත්‍රසූත්‍ර හා උපකරණ ආනයන වියදම ඉහළ ගිය අතර, දුම්රිය කටයුතු සඳහා යොදා ගනු ලබන උපකරණ සහ ටැංකි හා බවුසර, බස්රථ සහ කැබ් රථ වැනි වාණිජ කටයුතු සඳහා යොදා ගනු ලබන රථවාහන ආනයන ඉහළ යෑම හේතුවෙන් ප්‍රවාහන උපකරණ ආනයන වියදම ඉහළ ගියේය. මීට අමතරව, පාලම් හා පාලම් කොටස්වලට අදාළ වන යකඩ හා වානේ ආනයනය ඉහළ යෑම හේතුවෙන් ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම ඉහළ ගියේය.
- 2018 වසරේ සැප්තැම්බර් මාසයට සාපේක්ෂව 2019 වසරේ ආනයන පහත වැටීම සඳහා ආනයන මිල ගණන් පහළ යෑම මුළුමනින්ම හේතු වූ බව පිළිබිඹු කරමින්, මෙම මාසයේදී ආනයන පරිමා දර්ශකය සියයට 2.8 කින් ඉහළ ගිය අතර ආනයන මිල දර්ශකය සියයට 5.9 කින් පහත වැටුණි.

**රූප සටහන 6: මාසික ආනයන ක්‍රියාකාරිත්වය**




මූලය: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 7: ආනයන පරිමා දර්ශකය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 3: වෙළඳ භාණ්ඩ ආනයන වියදම (අ)**

| කාණ්ඩය | 2018 සැප්. (එ.ජ. ඩොලර් මිලියන) | 2019 සැප්. (එ.ජ. ඩොලර් මිලියන ) | වෙනස (%) | 2018 ජන.- සැප්. (එ.ජ. ඩොලර් මිලියන) | 2019 ජන.- සැප්. (එ.ජ. ඩොලර් මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **379.3** | **312.8** | **(17.5)** | **3,820.6** | **2,812.0** | **(26.4)** |
| ආහාර හා පාන වර්ග | 91.0 | 92.2 | 1.3 | 1,239.2 | 1,009.3 | (18.5) |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත | 2.3 | 2.6 | 15.8 | 115.5 | 24.8 | (78.5) |
| කිරි නිෂ්පාදිත | 12.9 | 8.9 | (31.4) | 244.1 | 225.0 | (7.8) |
| එළවළු | 15.2 | 20.0 | 32.2 | 235.5 | 207.6 | (11.9) |
| මුහුදු ආහාර | 14.0 | 14.3 | 1.9 | 150.0 | 160.0 | 6.7 |
| සීනි හා රසකැවිලි | 15.9 | 16.2 | 2.4 | 196.7 | 142.6 | (27.5) |
| කුළුබඩු | 11.2 | 11.4 | 1.9 | 84.3 | 79.5 | (5.7) |
| පාන වර්ග | 6.8 | 6.2 | (8.7) | 64.2 | 58.3 | (9.3) |
| වෙනත් ආහාර හා පාන වර්ග | 12.8 | 12.5 | (2.4) | 148.8 | 111.5 | (25.1) |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 288.2 | 220.6 | (23.5) | 2,581.4 | 1,802.7 | (30.2) |
| පෞද්ගලික රථවාහන | 138.2 | 70.1 | (49.2) | 1,230.6 | 566.5 | (54.0) |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 44.3 | 48.9 | 10.4 | 393.5 | 399.4 | 1.5 |
| රෙදිපිළි හා උපාංග | 22.7 | 29.2 | 28.4 | 237.4 | 203.6 | (14.2) |
| ගෘහ උපකරණ | 17.5 | 15.3 | (12.9) | 176.2 | 146.6 | (16.8) |
| විදුලි සංදේශ මෙවලම් | 22.4 | 16.3 | (27.3) | 207.1 | 173.4 | (16.2) |
| ගෘහ හා දැව භාණ්ඩ | 16.9 | 18.0 | 6.4 | 129.0 | 122.7 | (4.9) |
| වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 26.2 | 22.9 | (12.7) | 207.7 | 190.5 | (8.3) |
| **2. අන්තර් භාණ්ඩ** | **1,056.0** | **1,000.7** | **(5.2)** | **9,412.8** | **8,380.5** | **(11.0)** |
| ඉන්ධන | 396.3 | 353.7 | (10.7) | 3,165.1 | 2,930.5 | (7.4) |
| එයින් බොරතෙල් | 118.7 | 98.6 | (17.0) | 714.0 | 729.3 | 2.1 |
| පිරිපහදු කළ ඛනිජතෙල් | 277.5 | 232.1 | (16.4) | 2,303.7 | 2,052.9 | (10.9) |
| ගල් අඟුරු | 0.03 | 23.0 | 84,251.3 | 147.3 | 148.3 | 0.7 |
| දියමන්ති, අගනා ගල් හා ලෝහ වර්ග | 11.3 | 20.7 | 83.4 | 529.6 | 139.1 | (73.7) |
| එයින් රත්‍රන් | 0.1 | 0.6 | 608.9 | 438.1 | 2.3 | (99.5) |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 233.7 | 250.3 | 7.1 | 2,091.6 | 2,127.1 | 1.7 |
| රසායනික නිෂ්පාදිත | 69.1 | 67.8 | (1.9) | 671.0 | 621.3 | (7.4) |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 50.0 | 50.2 | 0.4 | 521.8 | 445.1 | (14.7) |
| කඩදාසි හා ඝන කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 49.0 | 40.6 | (17.1) | 394.8 | 336.1 | (14.9) |
| මූල ලෝහ | 57.5 | 42.5 | (26.1) | 473.1 | 408.7 | (13.6) |
| පොහොර | 34.5 | 30.0 | (13.1) | 187.8 | 167.5 | (10.8) |
| තිරිඟු හා ඉරිඟු | 36.7 | 30.5 | (17.0) | 272.6 | 233.9 | (14.2) |
| ආහාර සැකසුම් | 26.1 | 14.4 | (44.8) | 234.0 | 169.3 | (27.7) |
| කෘෂිකාර්මික යෙදවුම් | 17.3 | 13.6 | (21.4) | 153.4 | 140.7 | (8.3) |
| ඛනිජ නිෂ්පාදිත | 7.6 | 22.0 | 187.8 | 137.3 | 159.0 | 15.8 |
| වෙනත් අන්තර් භාණ්ඩ | 66.8 | 64.4 | (3.5) | 580.6 | 502.1 | (13.5) |
| **3. ආයෝජන භාණ්ඩ** | **332.4** | **396.6** | **19.3** | **3,544.6** | **3,398.4** | **(4.1)** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 175.7 | 206.5 | 17.5 | 1,878.7 | 1,816.7 | (3.3) |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 127.6 | 136.5 | 7.0 | 1,140.7 | 1,143.4 | 0.2 |
| ප්‍රවාහන උපකරණ | 28.8 | 53.2 | 84.7 | 520.8 | 433.4 | (16.8) |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 0.3 | 0.4 | 20.2 | 4.6 | 4.9 | 7.0 |
| **4. වර්ග නොකළ ආනයන** | **0.7** | **0.4** | **(41.9)** | **73.0** | **5.2** | **(92.9)** |
| **මුළු ආනයන** | **1,768.4** | **1,710.5** | **(3.3)** | **16,851.1** | | **(13.4)** |

... සැලකිය යුතු නොවේ

(අ) තාවකාලික

මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

## ජංගම ගිණුම වෙත වාර්තා වූ අනෙකුත් ප්‍රධාන ලැබීම්

- පාස්කු ඉරු දින සිදු වූ ප්‍රහාරවලින් පසුව බලපෑමට ලක් වූ සංචාරක පැමිණීම් මෑත කාලයේදී යථා තත්ත්වයට පත්වීමක් දක්නට ලැබුණි. 2019 සැප්තැම්බර් මාසයේ සංචාරක පැමිණීම් 108,575 ක් වාර්තා වූ අතර එය පෙර වසරේ අනුරූප මාසවලට සාපේක්ෂව, 2019 වසරේ අගෝස්තු මාසයේ වූ සියයට 28.3 ක අඩුවීම සහ ජූලි මාසයේදී වූ සියයට 46.9 ක අඩු වීමට සාපේක්ෂව සියයට 27.2 ක අඩු වීමකි. මෙම පහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව චීනය සහ එක්සත් රාජධානිය වැනි ප්‍රධාන රටවල්වලින් පැමිණි සංචාරකයින් ගණන අඩු වීමයි.
- 2018 සැප්තැම්බර් මාසයේදී වාර්තා වූ සංචාරක ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 280 ට සාපේක්ෂව 2019 සැප්තැම්බර් මාසයේදී සංචාරක ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 204 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. සමුච්චිත පදනම මත, සංචාරක ඉපැයීම් 2018 වසරේ පළමු මාස නවය තුළදී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 3,251 ට සාපේක්ෂව මෙම වසරේ අනුරූප කාලය තුළදී එ.ජ. ඩොලර් මිලියන 2,583 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.
- මේ අතර, 2019 සැප්තැම්බර් මාසයේදී, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 516 ක් දක්වා සියයට 3.3 කින් වැඩි විය. සමුච්චිත පදනම මත, 2019 වසරේ පළමු මාස නවය සඳහා විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ 2018 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 4,930 ක් දක්වා සියයට 6.6 කින් පහත වැටුණි.

**රූප සටහන 8: සංචාරක පැමිණීම්හි ප්‍රධාන මූලාශ්‍ර**




මූලය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**රූප සටහන 9: සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ**




මූලයන්: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, බලපත්‍රලාභී බැංකු, ශ්‍රී ලංකා මහ බැංකුව

## මූල්‍ය ලැබීම්

- 2019 වසරේ සැප්තැම්බර් මාසයේදී රුපියල්වලින් නාමනය කරන ලද රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් විදේශීය ආයෝජන එ.ජ. ඩොලර් මිලියන 7 ක ශුද්ධ ගෙවීමක් වාර්තා විය. සමුච්චිත පදනම මත, වසරේ පළමු මාස නවය තුළදී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් වූ ශුද්ධ ගෙවීම් එ.ජ. ඩොලර් මිලියන 291 ක් විය.
- ප්‍රාථමික හා ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු ඇතුළුව කොළඹ කොටස් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන, 2019 වසරේ සැප්තැම්බර් මාසයේදී එ.ජ. ඩොලර් මිලියන 7 ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය. එසේ වුවද, 2019 වසරේ පළමු මාස නවය තුළදී කොළඹ කොටස් වෙළඳපොළ වෙත එ.ජ. ඩොලර් මිලියන 15 ක ශුද්ධ ලැබීමක් වාර්තා විය.
- තවද, 2019 සැප්තැම්බර් මාසයේදී රජය වෙත වූ දිගුකාලීන ණය, එ.ජ. ඩොලර් මිලියන 137 ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය.

## ජාත්‍යන්තර සංචිත

- 2019 වසරේ සැප්තැම්බර් මස අවසානය වනවිට දළ නිළ සංචිත එ.ජ. ඩොලර් බිලියන 7.6 ක් වූ අතර, එය ආනයනික මාස 4.6 කට සමාන විය. මේ අතර, දළ නිල සංචිත හා බැංකු අංශයේ විදේශීය වත්කම්වලින් සමන්විත මුළු විදේශීය වත්කම් ප්‍රමාණය, 2019 සැප්තැම්බර් මස අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 10.4 ක් වූ අතර, එය ආනයනික මාස 6.2 කට සමාන විය.

**රූප සටහන 10: දළ නිල සංචිත සහ සංචිත ප්‍රමාණාත්මකභාවය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## විනිමය අනුපාතිකයේ හැසිරීම

- 2019 සැප්තැම්බර් මාසයේදී ශ්‍රී ලංකා රුපියල යම් අවප්‍රමාණය වීමේ පීඩනයකට ලක් වුවද, මෙම වසරේ සැප්තැම්බර් අවසානය දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී ශ්‍රී ලංකා රුපියල අතිප්‍රමාණය විය. එමෙන්ම, 2019 වසරේ නොවැම්බර් මස 15 වැනි දින දක්වා කාලපරිච්ඡේදය තුළදී ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 1.4 කින් අතිප්‍රමාණය විය. අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින් මෙම කාලපරිච්ඡේදය තුළදී ශ්‍රී ලංකා රුපියල, ස්ටර්ලින් පවුම, ජපන් යෙන් සහ කැනේඩියානු ඩොලරය හැර අනෙකුත් සියලු ප්‍රධාන ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව අතිප්‍රමාණය විය.

**රූප සටහන 11: එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි අගය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 4: තෝරාගත් ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි වෙනස්වීම**

| මුදල් ඒකකය | 2018 | 2019 (නොවැ. 15 දක්වා) අවප්‍රමාණය (-)/ අතිප්‍රමාණය (+) |
|---|---|---|
| එ.ජ. ඩොලරය | -16.4% | +1.4% |
| යුරෝ | -12.7% | +5.1% |
| ස්ටර්ලින් පවුම | -11.4% | -0.2% |
| ජපන් යෙන් | -18.1% | -0.3% |
| කැනේඩියානු ඩොලරය | -9.3% | -1.5% |
| ඕස්ට්‍රේලියානු ඩොලරය | -7.6% | +5.2% |
| ඉන්දියානු රුපියල | -8.7% | +4.3% |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව